

# මට්සුෂිතාතුමාගේ ජීවිතය

## ළමා කාලය

කොනොසුකේ මට්සුෂිතා 1894 නොවැම්බර් 27 වන දින උපත ලදි.ඔහු ළමයින් 8 දෙනෙකුගෙන් යුතු පවුලක බාලයා විය. ඔහුගේ පියා වකයාමා ප්‍රාන්තයේ වසා නම් කෘෂිකාර්මික ගම්මානයක සමෘද්ධිමත් ඉඩම් හිමි පුද්ගලයෙක් විය. මට්සුෂිතා ධනවත් පවුලක උපත ලැබුවද ඔහුගේ පියාගේ මූලිකවම සහල් වෙළඳාම සම්බන්ධව කළ අදූරදර්ශී ආයෝජන හා තීරණ නිසා දිලිඳු බවට පත්විය.1899 දී පවුලේ සියලුම ධනය විනාශ වී, වටිනාකමක් තිබූ සියලුම බඩු භාණ්ඩද විකිණීමට සිදුවිය. මට්සුෂිතා පවුල නගරයේ නිදන කාමර 3 ක් ඇති සනීපාරක්ෂක තත්ව හීන ගෙයකට මාරු විය.හැමවිටම ආහාර හිඟයක් පැවතින.ඇඳුම් හා බෙහෙත්ද එසේම වින.අවුරුදු කීපයකින් මට්සුෂිතා ගේ සෞඛ්‍යය ශීඝ්‍රයෙන් පිරිහී යන්නට විය.ඔහුගේ සහෝදර සහෝදරියන් තිදෙනෙක්ද බෝවන රෝග වලදී මිය ගියේය.ඔවුන්ගේ පවුලේ අභාග්‍යය තවත් වැඩිවී මට්සුෂිතාගේ ඉගෙනීමද අතරමගදී කඩාකප්පල් විය.වයස 9 වන විට ඔහුගේ ඉගෙනීම නතර කිරීමට සිදුවිය.

## යෞවනය හා වැඩිහිටි වයස

මට්සුෂිතා පාසල් ගමන නතර කිරීමෙන් පසු ඕසකා වල හිබචි සාප්පුවක අත්උදවුකරුවෙකු ලෙස වැඩ කිරීමට යැවින.ඔහුගේ අත් උදවු වැඩයට අවුරුද්දක් ගත වීමටත් පෙර හිබචි සාප්පුව වැසීමට සිදුවී , මට්සුෂිතාට වෙනත් ආදායම් මාර්ගයක් සෙවීමට සිදුවිය.එය බයිසිකල් අලුත්වැඩියා කරන සාප්පුවක අත්උදවු වැඩක් විය.ඔහුට මෙය වයස 15 වන තෙක් කිරීමට සිදුවිය.මෙම වකවානුව විදුලි බලය පැතිරී යන කාලය විය. මට්සුෂිතාට මෙය අලුත් තාක්ෂණික යුගයක ආරම්භය ලෙස හැඟින.මෙම නවතම කර්මාන්තයේ කොටස්කරුවෙකු වීමට අධිෂ්ඨාන කරගත් මට්සුෂිතා ඕසකා විදුලි ආයතනයේ රැකියාවකට ඉල්ලුම් කළේය.එය විදුලි උපාංග නිපදවන ආයතනයක් විය.ප්‍රථමයෙන් ඔහු වයරින් අත් උදවු කරුවෙකු ලෙස සේවය කළද ඉගේනීමට ඇති ආශාව නිසා විදුලි

කාර්මික ශිල්පියෙකු බවට පත්විය.ඊලඟ වසර කිහිපය තුල ආයතනයේ මට්සුෂිතාගේ තත්වය කිහිපවරක් උසස් විය.ඔහුට කිහිපවරක්ම උසස්වීම් ලැබිණ.මේ වකවානුවේ මට්සුෂිතා සහෝදරියකුගේ යහලුවෙකුට හඳුන්වා දෙනු ලැබිය. මට්සුෂිතා මෙම හඳුන්වාදීමෙන් දැනඅඳිනගත් මුමෙනෝ ඉඋයේ සමග විවාහ විය.විවාහයේ බර කරට ගත් මට්සුෂිතාට වයස 22දී විදුලි පිරික්සුම් කරන්නෙක් ලෙස උසස්වීමක් ලැබින.සාමාන්‍ය ඉගෙනීමක් ලැබූ මට්සුෂිතාට එහි මහත් ගෞරවනීය තත්වයක් හා උසස් වැටුපක් ලෙස හැඟින.මෙම වකවානුවේ මට්සුෂිතා ඔහුගේ ප්‍රධානියාට තමන්ගේ විවේක කාලයේදී වැඩිදියුණු කළ විදුලි පේනුව හඳුන්වා දෙනු ලැබීය.එහෙත් ඔහුගේ ප්‍රධානියා මෙයට එතරම් උනන්දුවක් නොදැක්වූයෙන් මට්සුෂිතා අධෛර්‍යයට පත්විය.මින් පසු මට්සුෂිතා ඔහුගේ රැකියාවට ඇති උනන්දුව හා ආශාව අත්හැරියේය.මෙය ඔහුගේ ජීවිතයේ සන්ධිස්ථානයක් විය.

මට්සුෂිතා විදුලි කාර්මික ආයතනය

1917දී මට්සුෂිතා ඕසකා විදුලි ආයතනයෙන් නික්ම තමාගෙම ආයතනයක් පටන් ගති. හරිහැටි ප්‍රාග්ධනයක් ,විධිමත් අධ්‍යාපනයක් හා පලපුරුද්දක් නැති මට්සුෂිතාගේ ආයතනය පටන්ගැනීමටත් පෙරෙතුව කඩාකප්පල්වීමේ හැකියාවක් තිබින.එහෙත් තමාගේ අධිෂ්ඨානයෙන් හා අභිලාශයෙන් අභිමි සම්පත් ජයගත් මට්සුෂිතා ඔහුගේ ආයතනය තම නිවසේ පහළ මාළයේ තමාගේ බිරිඳ,මස්සිනා හා සහකරුවන් කීපදෙනෙක් සමග පටන් ගති. තමාගේ නිෂ්පාදනයේ සාම්පල කීපයක් සාදාගත් මට්සුෂිතා බයිසිලකලයෙන් ඒවා තොග වෙලෙන්දන් ලඟට ගෙන ගියද එකම නිෂ්පාදනයක් පමණක් තිබීම නිසා ප්‍රතික්ෂේප කෙරිණ.මේ නිසා මට්සුෂිතාගේ සහකරුවන් ඔහු අතහැර ගොස් මට්සුෂිතා,බිරිඳ හා මස්සිනා පමණක් ඉතිරිවන තත්වයට පත්වීය.නියත බංකොලොත්භාවයට පත්වීමට තිබුනද අනපේක්ෂිතව ලැබුනු විදුලි පංකා විද්‍යුත් පරිවාරක දහසක ඇනවුමක් නිසා ඉන් ගැලවීමට ඉඩක් ලැබින.එතැන් පටන් මට්සුෂිතාට ඔහුගේ විද්‍යුත් පේනු නිශ්පාදනය අඛණ්ඩව කරගෙන යෑමට හැකිවූ අතර නිශ්පාදනවල ඇති උසස් තත්වය හා අඩු මිල නිසා තොග වෙලෙන්දන් අතර හොඳ නමක් දිනා ගැනීමට හැකියාවක් ලැබින. මට්සුෂිතාගේ නිෂ්පාදන ප්‍රථමයෙන් "නැෂනල්" යන නමින් නිපදවූවද පසුව වඩාත් ප්‍රසිද්ධ වූ පැනසොනික්,ක්වාසර් හා ටෙක්නික්ස් යන නම්ද ඈඳා ගන්නා ලදි.

ව්‍යාප්තිය

තමාගේ ආයතන වර්ධනය කිරීමේදී මට්සුෂිතා වැදගත් පාඩමක් ඉගෙනගත් තැනක් වූයේ ඔහුගේ බයිසිකල් ලාම්පු තොග වෙලෙන්දන්ට හඳුන්වා දුන් තැනයි.එනම් වෙළඳ පොලේ ඇති සියලුම නිෂ්පාදනවලට වඩා උසස්

නිෂ්පාදනයන් තමා සතු වුවද විකුණා ගැනීමට නොහැකි වුවහොත් එයින් ප්‍රයෝජනයක් නැති බවය.මේ නිස මට්සුෂිතා නිෂ්පාදනය කෙරෙහි අවධානය අඩුකර වැඩි අවධානයක් අලෙවිකරනය හා අලෙවි කණ්ඩායම් කෙරෙහි යොමුකිරීමට පටන් ගති.මෙය ගබඩා කාමර දාමයක් දක්වා වර්ධනය වී මට්සුෂිතා ආයතනය ජපාන විදුලි නිශ්පාදන කර්මාන්ත සිතියමේ එක් අංශයක් බවට පත්විය.

1929දි මට්සුෂිතා ඔහුගේ ආයතනය අලුතින් සංවිධානය කළේය. මට්සුෂිතා ආයතනය මව් ආයතනය ලෙසද තමන්ගේ එක් එක් නිපයුම් වලට සුවිශේෂී වූ ශාඛා ආයතනද පටන් ගති.මේ වකවානුවේ මට්සුෂිතා ආයතනයේ නිපයු සුවිශේෂී නිපයුම් 3කි.බියිසිකල් පහන් හා විද්‍යුත් බැටරි අංශය, විද්‍යුත් ජේනු අංශය හා ගුවන් විදුලි අංශය ඒවා විය.මේ ප්‍රාදේශීය ආයතනවලට නිශ්පාදනය හා අලෙවිකරණ සංවිධානයේ වගකීම භාරවිය.නිශ්පාදන තමන්ගේ නිශ්පාදනවලට ඇති වූ ඉල්ලුමට අනුව මෙහෙයවිණි.මෙහි ප්‍රතිඵලයක් ලෙස අලෙවියට අනුව නිශ්පාදනය තීරණය විය.

මට්සුෂිතා හා නූතන යුගය

1947දි කොනොසුකේ මට්සුෂිතා ඔහුගේ මස්සිනා වන තොෂියෝට බයිසිකල් පහන් නිශ්පාදනය සඳහා නවීනතම නිෂ්පාදනාගාරයක් භාර කෙරීය.මෙය “සන්යෝ විදුලි උපාංග” නම් විය.

මට්සුෂිතා ආයතනය 1950 සිට “ පැනසොනික්” හා “ටෙක්නික්” යන ලෝකප්‍රසිද්ධ නම් වලින් ලෝකයේ විශාලතම විදුලි උපාංග නිශ්පාදනාගරයක් බවට පත්විය.

මට්සුෂිතා 1954 JVC ආයතනයේ හා එකතු වී එහි සැලකිය යුතු කොටස් ප්‍රමානයක් හිමිකර ගති.1973 දි මට්සුෂිතා තමන්ගේ ආයතනයෙන් විශ්‍රාම ලබන විට තමන්ගේ සමාජයීය හා ආර්ථික දර්ශනයන් උදෙසා පොත් 44 ලියා තැබීය.එයින් එකක වන “සංවර්ධනය උදෙසා සමෘද්ධිමත් සාමය හා සතුට පිරුනු මාර්ගයක්” යන පොත මිලියන 4කට වඩා විකිණී තිබිණි.

අප රටට මහත් ආදර්ශයක් ගත හැකි මට්සුෂිතාතුමාගේ චරිතය අප්‍රතිහත ධෛර්යය, අධිෂ්ඨානය,කැපවීම හා පරාජයෙන් පසු නොබැසීම යන මනුෂ්‍ය ගුණාංග අපහට කියාදුන් විශ්ව සම්භාවනාවට පාත්‍ර වූ පුද්ගලයෙකි.මේ ලිපිය එවන් පුද්ගලයින් ශ්‍රී ලංකාවෙන්ද බිහිවීමට මුල් පිරීමක් වේවා.

හරිත වනිගසේකර